සැ. යු. - 2008.05.02 දින පළ වූ අංක 1,548 දරන ගැසට් පත්‍රයේ I/III, II, III සහ IV (ආ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,549 - 2008 මැයි මස 09 වැනි සිකුරාදා - 2008.05.09

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 510 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 511 |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 515 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 520 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට් නිවේදන* බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 මැයි මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 මැයි මස 02 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - අවිස්සාවේල්ල

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2008.05.25 දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර් අවසරය ඇතිව වෙන්දේසියට පැය 1/2කට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමත පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේදී මිළ දී ගනු ලබන ද්‍රව්‍යයන් එවේලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලු ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් මිළ දී ගන්නා ද්‍රව්‍ය සඳහා ගැනුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

ටිකිරි කේ. ජයතිලක,
මහෙස්ත්‍රාත් - අවිස්සාවේල්ල.

2008 අප්‍රේල් මස 21 වැනි දින,
අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1. | 38460 | අංක 103 - 9261 දරන යතුරු පැදිය |
| 2. | 43536 | අංක 135-5300 වේල් යතුරු පැදිය |
| 3. | 37965 | අංක රහිත යතුරු පැදිය |
| 4. | 11633 | අංක රහිත අබලන් යතුරු පැදිය |
| 5. | 10910 | අංක 113-7436 යතුරු පැදිය |
| 6. | ඒ. 2596 | අංක අපැහැදිලි යතුරු පැදිය |
| 7. | ඒ. 8975 | අංක රහිත යතුරු පැදිය |
| 8. | ඒ. 9454/03 | අංක 124-9209 යතුරු පැදිය |
| 9. | 24384 | අංක රහිත යතුරු පැදිය |
| 10. | ඒ. 1623 | විදුලි කියතක් |
| 11. | අංක රහිත | කටුකම්බි රෝලක් |
| 12. | ඒ 8975/96 | හෙල්මට් 01 |
| 13. | අංක රහිත | වාහන බොනට් 01 |
| 14. | අංක රහිත | කුළු ගෙඩි 01යි, ගල් කටු 03යි |
| 15. | ඒ. 5708/07 | ලොකු කඹ 01යි |
| 16. | 45139 | වතුර මෝටරයක් |
| 17. | 38575 | පාපැදිය |
| 18. | 83667 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 19. | ඒ. 3897/06 | රන් භාණ්ඩ කිරන කුඩා තරාදියක් |
| 20. | 87298 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 21. | 81737 | පා පැදිය |
| 22. | ඒ. 4843/07 | වාහන ටියුබ් 01 |
| 23. | ඒ. 4847/07 | නූල් පන්දු අඩංගු උර 16 |
| 24. | ඒ 5190/07 | ඔට්ටපාලු අඩංගු උරයක් |
| 25. | 66103 | නයිලෝන් කඹයක්, තාච්චි 02, රාත්තල් 06 මිටියක් |
| 26. | 33072 | කැසට් යන්ත්‍ර 01 |
| 27. | 41250 | ඉරුම් කියත් 01 |
| 28. | 39713 | කැසට් යන්ත්‍ර 01 |
| 29. | බී 2332/03 | රබර් ෂීට් 12 |
| 30. | 53527 | වාහන ජැක් 01 |
| 31. | ඒ 7223 | පා පැදිය |
| 32. | ඒ 8726/03 | පා පැදිය |
| 33. | ඒ 8426 | පා පැදිය |
| 34. | ඒ 6924/01 | පා පැදිය |
| 35. | ඒ 9035/03 | පා පැදිය |
| 36. | ඒ 1374 | පා පැදිය |
| 37. | ඒ 1371 | පා පැදිය |
| 38. | ඒ 1373 | පා පැදිය |
| 39. | ඒ 660 | පා පැදිය |
| 40. | ඒ 1400 | පා පැදිය |
| 41. | ඒ 3336 | පා පැදිය |
| 42. | ඒ 1372/04 | පා පැදිය |
| 43. | ඒ 9034/03 | පා පැදිය |
| 44. | ඒ. 9605/03 | පා පැදිය |
| 45. | ඒ. 9215/03 | පා පැදිය |
| 46. | 8202/96 | පා පැදිය |
| 47. | ඒ 67 | පා පැදිය |
| 48. | 5498 | පා පැදිය |
| 49. | 6524/2001 | පා පැදිය |
| 50. | අංක රහිත | දෙකට නමන ලද අඩි 08ක් පමණ දිග කම්බි 04 |
| 51. | අංක රහිත | කොරොස් 01 |
| 52. | 72649 | විල් බැරෝ 01 |
| 53. | අංක රහිත | විල්බැරෝ ප්‍රේම් 01 |
| 54. | අංක රහිත | අඩි 07 ක් පමණ දිග දම්වැල් 01 |
| 55. | අංක රහිත | මේන් වයර් රෝල් 02 |
| 56. | අංක රහිත | රොබින් වර්ගයේ වතුර මෝටරය |
| 57. | අංක රහිත | ජැක් 01 |
| 58. | අංක රහිත | මේස තරාදියක යට කොටස |
| 59. | අංක රහිත | තරාදි පඩි කිහිපයක් |
| 60. | අංක රහිත | ලොකු ඇලුමිනියම් මුට්ටි 02 |
| 61. | බී 6464/87 | කඹයක් |
| 62. | අංක රහිත | වයර් ගුලියක් |
| 63. | අංක රහිත | තාච්චි 02 |
| 64. | අංක රහිත | වයර් 02 ක් එකට අඹරන ලද රෝලක් |
| 65. | අංක රහිත | ඇඳුම් උදලු තල 15ක් |
| 66. | ඒ 1854/05 | සවල් 03, ඇඳුම් උදලු තල 03 |
| 67. | 4183/06 | නයිලෝන් කඹ 02, බාල්දි 02 |
| 68. | ඒ 2976 | පාපැදිය (කුඩා) |
| 69. | 85378 | ගෑස් සිලින්ඩර් 01 සහ ගෑස් ලිපක් |
| 70. | 82222 | ගෑස් සිලිනඩර් 01 |
| 71. | 82413 | ගෑස් සිලින්ඩර් 01 |
| 72. | අංක රහිත | ඉරුම් කියත් 03 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 73. | අංක රහිත | බෆල් 02 |
| 74. | අංක රහිත | වීදුරු 06 |
| 75. | අංක රහිත | තාච්චි 02 |
| 76. | අංක 41250 | පලන්චි කියත් 01 |
| 77. | අංක රහිත | පලන්චි කියත් 08 |
| 78. | අංක රහිත | අත් කියත් 01 |
| 79. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි 02, සාස්පාන් 01, ජෝගු 01 |
| 80. | අංක රහිත | තරාදි පඩි 04 |
| 81. | අංක රහිත | ගැල්වනයිස් බට 02 |
| 82. | අංක රහිත | පැට්‍රල් ලාම්පු ටැංකි 02 |
| 83. | අංක රහිත | වයර් තොගයක් (නොහොත් කවරයක්) |
| 84. | අංක රහිත | පිකස් 02 |
| 85. | අංක රහිත | පොරෝ 02 |
| 86. | අංක රහිත | කුළුගෙඩි 02 |
| 87. | අංක රහිත | ඉල්ලන්කුරු 09 |
| 88. | අංක ඒ 7905/2 | වාහන අමතර කොටස් කිහිපයක් (පොහොර කවරයක) |
| 89. | අංක රහිත | පැට්‍රල් ලාම්පු 01 |
| 90. | අංක රහිත | වතුර මෝටර් 01 |
| 91. | අංක ඒ 7316/01 | කැසට් යන්ත්‍ර 01 |
| 92. | අංක රහිත | වේලන ලද රබර් ෂීට් කිහිපයක් |
| 93. | අංක රහිත | කොරොස් 01, ඇතිලි 01, මැටි කෝප්ප 01, නැඹිලි 01, රොටී තැටි 01, ඉදි ආප්ප වංගෙඩි 01, මුට්ටි 01, (ඇලුමිනියම්) (පොහොර උරයක) |
| 94. | අංක රහිත | රබර් ෂීට් කිහිපයක් |
| 95. | අංක රහිත | මේස තරාදි 02 |
| 96. | අංක රහිත | කැති 01 |
| 97. | අංක රහිත | වාහන බැටරි 03 |
| 98. | අංක 87405 | ඇලුමිනියම් ඇතිලි 01, කේතල් 01, උදලු තල 01 |
| 99. | අංක රහිත | වතුර මෝටර් 01 |
| 100. | අංක රහිත | අබලන් කාබියුලේටර් 01 |
| 101. | අංක රහිත | මෝටර් 01 |
| 102. | අංක රහිත | වාහන ජැක් 01 |
| 103. | අංක අපැහැදිලි | වාහන ජැක් 01 |
| 104. | අංක ඒ861/93 | වාහන ජැක් 01 |
| 105. | අංක ඒ8199/02 | කැති 01 |
| 106. | අංක රහිත | මිටියක් |
| 107. | අංක රහිත | වතුර මෝටරයක් |
| 108. | අංක 60831 | අත්මේස් තොගයක් |
| 109. | අංක රහිත | පාපැදි තොගයක් |
| 110. | අංක රහිත | කඹ 02 |
| 111. | අංක රහිත | නයිලෝන් කඹ 01 |
| 112. | අංක රහිත | ගෑස් ලිප් 02 |
| 113. | අංක රහිත | ඇලුමිනියම් බට 01 |
| 114. | අංක රහිත | සවල් 03 |
| 115. | අංක රහිත | යකඩ 03 |
| 116. | අංක රහිත | 1/4 කම්බි මිටියක් |
| 117. | අංක රහිත | බන්ඩි කියත් 01 |
| 118. | අංක රහිත | උදලු 04 |
| 119. | අංක රහිත | යකඩ ප්‍රේම් 01 |
| 120. | අංක රහිත | ප්ලාස්ටික් කල 01 |

05-171

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2008/2009 වර්ෂය
(2008 ජූලි මස 01 සිට 2009 ජුනි මස 30 දක්වා)

2008 ජූලි මස 01 දින සිට 2009 ජුනි මස 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක් ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිළ ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ අංක ............................ දරන .................................................. රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2008.05.21 දින පෙ. ව. 10.00 ට පෙර පුත්තලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර පුත්තලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුලත් විය යුතුය.

05. 2008.05.21 දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලු ම ටෙන්ඩර්කරුවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුත්තලම ප්‍රාදේශීය ලේක්ම් කාරයාලයෙන් ලබාගත හැකිය.

එම්. ආර්. එම්. මලික්,
ප්‍රාදේශීය ලේකම්.

2008 අප්‍රේල් මස 24 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පුත්තලම.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| 01. | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සේනකුඩිරිප්පුව | පෙ. ව. 11.00<br>ප. ව. 5.0 | ප. ව. 2.00<br>රාත්‍රී 8.0 | 2008.05.21<br>පෙ. ව. 10.00 | රු. 1,000 |

05-166

---

**හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම -2008/2009 වර්ෂය

2008 ජූලි මස 01 දින සිට 2009 ජුනි 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙන් දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් (15%) වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි අංක ——— දරන ——— රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කර 2008.05.23 දින පෙ. ව. 10.00 ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වි ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2008.05.23 දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර බාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පෙනී සිටිය හැකිය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වන රා තැබෑරුම් නැවත විකිණීම 2008.06.09 දින පෙ. ව. 10.00 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* අවශ්‍යතාවයන්ට අනුකූලව විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
(දුරකථන අංකය 032-2223205)

යූ. එස්. එන්. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්.

2008අප්‍රේල් මස 21 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
හලාවත

**උපලේඛනය**

| *අනු අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය/තැබෑරුම* | *ටෙන්ඩර් භාරගන්නා දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| 01. | හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 02 දරන කොට්ඨාසය | ඉච්චම්පිටිය | 2008.05.23<br>පෙ. ව. 10.00 | 2,000 |
| 02. | හලාවත පලාත් ආණ්ඩු සභාවට අයත් අංක 03 දරන කොට්ඨාසය | කොට්ඨාසය තුළ වෙනත් සුදුසු ස්ථානයක් සොයා ගත යුතුයි. | එම | 1,000 |
| 03. | උතුරු පිටිගල් කෝරළය | ඔළිදඑව | එම | 250 |

05-96

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වෙන්නප්පුව**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2008/2009

2008 ජූලි මස 01 වන දින සිට 2009 ජූනි මස 30 වෙනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වෙනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජන රජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරා බදු බලපත්‍රයක්ම අදාලව එවකට පවත්වන කොන්දේසි මාලාවන්ට යටත්ව පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් බාර ගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ආකෘතිපත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් හා අදාල ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන්, යටත් පිරිසෙයින් 15% ට ලබා ගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක. .......................... .................. දරන ............රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුම් අංකය සහ නම සඳහන් කොට 2008 මැයි 22 සිට 2008 මැයි 28 වෙනි දින පෙ.ව. 10.00ට පෙර වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවටම පෙර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පනවා ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙන්* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුයි.

05. 2008.05.28 වන දින පෙ.ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර බාර ගැනීම, අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියළුම ටෙන්ඩර්කරුවන් වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06.පූර්වෝක්ත දින විකිණීමට නොහැකි රා තැබෑරුම් නැවත විකිණීම 2008.06.12 දින පෙ.ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ද ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එන්. ඩී. නාමරත්න,
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

*උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් ටෙන්ඩර් පත්‍ර බාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 01. | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තඹරවිල | 2008.05.28 පෙ.ව. 10.00ට | 500.00 |
| 02. | එම | නන්ජුන්ඩන්කරේ | එම | 250.00 |
| 03. | එම | වයික්කාල | එම | 1000.00 |
| 04. | එම | බොරලැස්ස | එම | 500.00 |
| 05. | එම | දුම්මලදෙණිය | එම | 1000.00 |
| 06. | එම | උල්හිටියාව | එම | 500.00 |
| 07. | එම | ලුණුවිල | එම | 500.00 |
| 08. | එම | වෙන්නප්පුව | එම | 2000.00 |
| 09. | එම | නයිනමඩම | එම | 1000.00 |

| *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|
| පෙ.ව. 11.00ට | ප.ව.2.00 |
| ප.ව. 5.00 | ප.ව.8.00 ට |

05-72

---

**නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2008 ජූලි මස 01 වැනි දින සිට 2009 ජූනි මස 30 වැනි දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2008 ජූලි මස 01 වැනි දින සිට 2009 ජූනි මස 30 දින දක්වා කාලය තුල රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසිය හා සෑම සුරාබදු බලපත්‍රයක්ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද, ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ............................දරන..................................රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2008.05.27 වැනි දින පෙ. ව. 10.00ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළවී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට අනුකූල විය යුතුය.

05. 2008 මැයි මස 27 වැනි දින පෙ. ව. 10.00ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2008.06.11 වැනි දින පෙ. ව. 10.00ට සිදු කරනු ලැබේ. එදිනද ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අදාළ විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

එස්. එම්. එල්. චන්ද්‍රසිරි,
ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

මගේ අංකය : නා/ආ/5/10/03,
2008 අප්‍රේල් මස 18 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ගම* | *ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|
| 01 | නාත්තන්ඩිය | මුදුකටුව | 2008.05.27 වැනි දින පෙ. ව. 10.00 | 1000 0 |
| 02 | එම | කටුනේරිය | එම | 1000 0 |

05-59

---

මගේ අංකය : ආර/ආ/04/08/01.

**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2008/2009 වර්ෂය 2008 ජූලි සිට 2009 ජුනි දක්වා

2008 ජූලි මස 01 දින සිට 2009 ජුනි මස 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරා බදු බලපත්‍රයක් ම අදාලව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත් ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාල ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක .................................. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2008.05.26 වැනි දින පෙ. ව. 10.00 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2008.05.26 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ තැබෑරුම් සඳහා නැවත විකිණීම 2008.06.10 දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඩී. සූරසිංහ,
ප්‍රාදේශීය ලේකම්/ආරච්චිකට්ටුව.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| ආනවිලුන්දන් | කරුකුපනේ | 10 | 2008.05.26 | 250 0 |
| ආනවිලුන්දන් | ආරච්චිකට්ටුව | 11 | පෙ. ව. 10.00 ට | 250 0 |
| ආනවිලුන්දන් | බත්තුලුඔය | 12 | | 250 0 |

05-153

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාරවිල, මින්න මැඩුම ප්‍රසිද්ධ නොතාරිස් අයි. සී. කලුආරච්චි මිය විසින් 2005 අගෝස්තු මස 28 වැනි දින ලියා සහතික කරන ලද අංක 3096 ඇටෝර්නි බලපත්‍රකාර මාරවිල, වීරහේන, වෙනිස් පාක් අංක 115 හි පදිංචි මැල්ලව තන්ත්‍රීගේ සුදත් ඉන්දික යන අය විසින් මාරවිල, වෙනිස් පාක්, අංක 115 හි පදිංචි මැල්ලව තන්ත්‍රීගේ ජානක පෙරේරා යන අය වෙත පවරා දෙන ලද සියළුම ඇටෝර්නි බලතල අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමු.

එම්. ටී. සුදත් ඉන්දික.

05-46

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) බුංගිරිය ගැම්දිරිය සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. බී. 3484, 2008.03.25
ලියාපදිංචි ලිපිනය : බුංගිරිය, කහවත්ත

අධ්‍යක්ෂ.

2008ක් වූ මාර්තු මස 25 වැනි දින දී ය.

05-47/1

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) නාබුළුව ගැමිදිරිය සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. බී. 3515, 2008.04.01
ලියාපදිංචි ලිපිනය : අංක 01, නාබුළුව, අටකලම්පන්න.

අධ්‍යක්ෂ.

2008 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින දී ය.

05-47/2

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) නුගවෙල ගැමිදිරිය සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. බී. 3516, 2008.04.01
ලියාපදිංචි ලිපිනය : නුගවෙල, කහවත්ත.

අධ්‍යක්ෂ.

2008 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින දී ය.

05-47/3

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) පහමුණුපන්න ගැමිදිරිය සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. බී. 3514, 2008.04.01
ලියාපදිංචි ලිපිනය : පහමුණුපන්න, මාදම්පෙ, අටකලම්පන්න.

අධ්‍යක්ෂ.

2008 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින දී ය.

05-47/4

### දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය අනුව කැටිරියස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2008.02.11 දින සංස්ථාගත කර ඇත. සමාගමේ අංකය පී. වී. 63014, කාර්යාලය, අංක 345, කටුවාන පාර, හෝමාගම.

ලේකම්.

05-64

---

### සිනෙත් මූවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2008 මාර්තු මස 05 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : යුරෝ වෙස්ට් මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 63313
ලියාපදිංචි කාර්යාලය : අංක 352/බී දෙමටගොඩ පාර, කොළඹ 09.

ආර්. සෙන්දිල් කුමරන්,
ලේකම්.

2008 අප්‍රේල් මස 05 වැනි දින.

05-65/1

---

### 2007 ජූලි මස 09 වැනි දින සංස්ථාපනය කරන ලද බව

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : වේව්ස් ඔෆ් හෝප් ප්‍රයිවට් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 62005
ලියාපදිංචි කාර්යාලය : අංක 2 1/2, වැන්ඩවැට් ප්ලේස්, දෙහිවල.

ආර්. සෙන්ති කුමරන්,
ලේකම්.

05-65/4

---

### සිනෙත් මූවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2008 අප්‍රේල් මස 02 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ලංකා පෙයිට් සොලූශන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය පී. වී. 63643
ලියාපදිංචි කාර්යාලය : අංක 179/2, කොටිකාවත්ත පාර, අංගොඩ, මුල්ලේරියාව නිව් ටවුන්.

ආර්. සෙන්තිකුමාරන්,
ලේකම්.

2008 අප්‍රේල් මස 16 වැනි දින.
05-65/3

### සිනෙත් මූවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2008 මාර්තු මස 05 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : යුරෝ වෙස්ට් කෙන්සල්ටෙන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 63312
ලියාපදිංචි කාර්යාලය : අංක 352/බී, දෙමටගොඩ පාර, කොළඹ 09.

ආර්. සෙන්දිල්කුමරන්,
ලේකම්.

2008 අප්‍රේල් මස 05 වැනි දින.

05-65/2

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

කුරුණෑගල, විල්ගොඩ වත්ත, අංක 200 දරන ස්ථානයේ පදිංචි කන්නන්ගර පතිරත්නලාගේ ඉඳුනිල් ආසිරි වන මම, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ආර්. කේ. සන්දිරිගම විසින් අත්සන් සහතික කරන ලද 2008.03.31 දින ලේඛනගත කරනු ලැබ ඇති 2008.03.24 දාතම අංක 154 ඇටෝර්නි බලපත්‍රය මත කුරුණෑගල, ශාන්ත ආනා වීදිය, අංක 24 දරන ස්ථානයේ පදිංචි මැල්කම් ටියුරින් ජයසිංහ වෙත මවිසින් පවරන ලද බලතල මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී මැල්කම් ටියුරින් ජයසිංහ විසින් මා වෙනුවෙන් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මවිසින් වග කියනු නොලැබේ.

කේ. පී. ඉඳුනිල් ආසිරි.

2008 අප්‍රේල් මස 18 වැනි දින.

05-70

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මග්ගෝන, මුංහේන හි පදිංචි කොස්සිංහල විතානගේ සරත්චන්ද්‍ර වන මා විසින් මග්ගෝන, මුංහේන, සංගමිත්තා මාවතේ පදිංචි කොස්සිංහල විතානගේ විමලසිරි යන අය වෙත ප්‍රසිද්ධ නොතාරිස් පියදාස හේවාලංකාර විසින් වර්ෂ 1998 ක් වූ අගෝස්තු මස 28 වැනි දින ලියා සහතික කරන ලද අංක 595 දරන ඇටෝර්නි බලපත්‍රය අද දින සිට එනම් වර්ෂ 2008 ක් වූ අප්‍රේල් මස 15 වැනි දින සිට සම්පූර්ණයෙන්ම බලරහිත කර අවලංගු කරන බව ශ්‍රී ලංකාවාසී සියළු දෙනා වෙත මෙයින් දන්වා සිටින අතර මින් පසුව එකී ඇටෝර්නි බලපත්‍රය උපයෝගී කරගෙන කරන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බවට ද මෙයින් දන්වා සිටිමි.

කොස්සිංහල විතානගේ සරත්චන්ද්‍ර.

2008 අප්‍රේල් මස 15 වැනි දින.
05-87

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන සමාගම 2008 අප්‍රේල් මස 02 වැනි දින සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඔවාටා හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 63685
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 9/13, සාතිස්සර මාවත, ගල්කිස්ස.

වරුණ විරාජ් මුනසිංහ,
අධ්‍යක්ෂක.

05-84

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනයයි.

බැග්ස් ඔෆ් ඇපීල් ප්‍රයිවට් ලිමිටඩ් 2008 මාර්තු 17 වන දින ලියාපදිංචි අංක පීවී 63476 යටතේ සංස්ථාපිතයි.

ලියාපදිංචි ලිපිනය : කියුල වත්ත, පනාගමුව, වංචාවල, ගාල්ල.

ජේ. කදිරහෙට්ටිආරච්චි,
ලේකම්.

05-81

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඇග්රිකල්චරල් ලෑන්ඩ් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 63206 දිනය : 2008.02.27
ලියාපදිංචි ලිපිනය : අංක 19/5, ගිල්ෆර්ඩ් ක්‍රෙසන්ට්, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

2008 මාර්තු මස 24 වැනි දින.

05-89

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් අංක (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) දෙමුවාත ගැමිදිරිය සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පීබී 3528 - 2008.04.21
ලියාපදිංචි ලිපිනය : දෙමුවාත, රක්වාන.

අධ්‍යක්ෂ.

2007 ක් වූ අප්‍රේල් මස 21 වැනි දින දී ය.

05-71

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : සෙන්ට්‍රල් ලංකා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.
සමාගමේ අංකය : පී.වී. 60473. 03/07/2007 දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 559, ඇරැව්වල, පන්නිපිටිය.

ඊ. එම්. තුසිත,
අධ්‍යක්ෂ.

05 -138/1

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : මින්ලි කොයර් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.
සමාගමේ අංකය : පී.වී. 61415, 17/09/2007 දින
ලියාපදිංචි ලිපිනය : අංක 406, බණ්ඩාරවත්ත පාර, සීදූව.

සමාගමේ ලේකම්.

05 -138/2

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : බේසිස් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 62072, 16/11/2007 දින
ලියාපදිංචි ලිපිනය : අංක 451, රූබන් අමරතුංග මාවත, කිරිවත්තුඩුව.

සමාගම් ලේකම්.

05 -138/3

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : සුරසළු එම්බ්‍රොයිඩරි (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 61890, 01/11/2007 දින,
ලියාපදිංචි ලිපිනය : අංක 444, පිළියන්දල පාර, මහරගම.

අධ්‍යක්ෂ.

05 -138/4

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඒ. එච්. එන් පැෂන් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 62314, 07/12/2007 දින
ලියාපදිංචි ලිපිනය : අංක 177 ඊ, මාලමුල්ල, පානදුර.

අධ්‍යක්ෂ.

05 -138/5

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : සම්මානි චාරිකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 61804, 24/10/2007 දින
ලියාපදිංචි ලිපිනය : අංක 7/සී/38, ජයවඩනගම බත්තරමුල්ල.

අධ්‍යක්ෂ.

05 -138/6

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. එන්. දිසානායක මහත්මිය විසින් 2001.06.24 දින දී ලියා සහතික කළ අංක 255 දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාර දෙහිවල, කළුබෝවිල සුනන්දාරාම මාවතේ, අංක 13/5 හි පදිංචි තන්ත්‍රිගේ ශ්‍රීනි විශාකා ද සොයිසා යන අය වෙත පවරා දෙන ලද සියළුම ඇටෝර්නි බලතල අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

සමරසිංහ ආරච්චිගේ ධර්මසේන.

05-132

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාර පහත දක්වා ඇති සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව මම මෙසේ දැනුම් දී සිටිමි:

සමාගමේ නම : සුවසෙවන මෙඩි කෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 25, යාලගල පාර, හොරණ
සමාගමේ අංකය : පී. වී. 63601
සමාගමක් කරන ලද දිනය : 2008.03.27

ලෙස්ලි විජේසිරිවර්ධන,
කළමණාකාර අධ්‍යක්ෂ.

05-107

---

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතන 02 ක සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී :

සමාගමේ නම : එන්'ස් සැලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 63703
ලියාපදිංචි දිනය : 2008.04.07
ලියාපදිංචි ලිපිනය : සාප්පු අංක 03, ෂොපින් ආකේඩ්, ට්‍රාන්ස් ඒෂියා හෝටලය, කොළඹ 02 ;

සමාගමේ නම : ලංකා නියුට්‍රි රයිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 63545
ලියාපදිංචි දිනය : 2008.03.24
ලියාපදිංචි ලිපිනය : අංක 615/15, රාජගිරිය ගාඩ්න්ස්, රාජගිරිය.

සී. වී. අමරසිංහ,
ලේකම්.

අංක 61/49, අඹවත්ත පාර, බොරලැස්ගමුව.

05-119

---

## සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව දැනුම්දීමයි

2007 වසරේ අංක 7 දරන සමාගම් ආඥාපනතේ අංක 9 වගන්තිය (1) ප්‍රකාරව වගන්ති 5 පරිදි වර්ෂ 2008ක් වූ අප්‍රේල් මස 02 වැනි දින බුටික් රිසෝට්ස් (පුද්ගලික) සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය : බුටික් රිසෝට්ස් (පුද්ගලික) සමාගම
සමාගම් ලියාපදිංචි අංකය : පී. වී. 63683
ලියාපදිංචි කාර්යාලය : අංක 83, ජෝර්ජ් ආර්. ද සිල්වා මාවත, කොළඹ 13.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

එස්. කේ. සී. මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

05-162

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ කරන දැන්වීමයි

සමාගමේ නම : ලංකා හෝම් ෆෝ චිල්ඩ්රන්
ලියාපදිංචි අංකය : ජී. ඒ. 2069
ලියාපදිංචි ලිපිනය : මවුන්ට් සයන් එස්ටේට්, තඹකන්ද, සඳලංකාව.

වී. ප්‍රනාන්දු,
අධ්‍යක්ෂක.

05-161

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

කොස්වත්ත තැපැල් සේවය තුළ 'පිනයන්ති ' නිවසේ පදිංචි අධිකාරි මුදලිගේ සාමා රංජනී අධිකාරි වන මා, කුයින්ස්ලන් සොලිසිටර් ඩොන්නා පී. ඕ. ඩොනොගොයි විසින් සහතික කරන ලද 2002.04.30 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කොස්වත්ත 'පිනයන්ති' නිවසේ පදිංචි වීරප්පෙරුම අතුකෝරල ආරච්චිගේ දොන් හෙක්ටර් ගාමිණී අප්පුහාමි මාගේ ඇටෝර්නි බලකරු ලෙස එකී ඇටෝර්නි බලපත්‍රය පිට මා වෙනුවෙන් කරනු කිසිදු ක්‍රියාවක් සඳහා මා වග නොකියන බව ශ්‍රී ලංකා වාසීන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධිකාරි මුදලිගේ සාමා රංජනී අධිකාරි,
"පිනයන්ති", කොස්වත්ත.

05-192/2

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාරවිල හාල්පන්විල පදිංචි විජේසිංහ ආරච්චිගේ අතුල ප්‍රසන්න අප්පුහාමි වන මම, 2001.06.01 වන දින එච්. ජේ. එම්. ඩී. ජයසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කළ 10915 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ඉහත ලිපිනයෙහිම පදිංචි විජේසිංහ ආරච්චිගේ සුසිල් කුමාර අප්පුහාමි මාගේ ඇටෝර්නි බලකරු ලෙස පත් කරමින් ලියන ලද ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවද, එකී ඇටෝර්නි බලකරු විසින් ඉහත කී බලපත්‍රය පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් මා මින් ඉදිරියට වගකීමක් නොමැති බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාම දැන ගනිත්වා.

විජේසිංහ ආරච්චිගේ අතුල ප්‍රසන්න අප්පුහාමි.

2008 අප්‍රේල් මස 08 වැනි දින.

05-192/1

---

### ඇටෝර්නි බලපත්‍ර අවලංගු කිරීම

මාරවිල මුදුකටුවේ පදිංචි අමරෝසිගේ මොරින් නිර්මලා හයිසින්ත් ප්‍රනාන්දු ද සහ එහිම පදිංචි වර්ණකුලසූරිය මලිත් නිලංක ප්‍රනාන්දු වන අප විසින් ඉතාලියේ ඒ. එම්. මාර්කෝ බොලොට්ට නොතාරිස් විසින් 2004.05.28 වැනි දින ලියා සහතික කළ ඇටෝර්නි බලපත්‍රය සහ ඉහත කී අමරෝසිගේ මොරින් නිර්මලා හයිසින්ත් ප්‍රනාන්දු වන මා විසින් තනිව 2003.07.02 වැනි දින එච්. ජේ. එම්. ඩී. ජයසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කළ 12625 දරන ඇටෝර්නි බලපත්‍රයද මගින් වෙන්නප්පුව උල්හිටියාවේ අංක 147 හි පදිංචි අමරෝසිගේ මර්ල් හයිජිනස් ප්‍රනාන්දු අපගේ ඇටෝර්නි බලකරු ලෙස පත්කරමින් ලියන ලද ඇටෝර්නි බලපත්‍ර මෙයින් අවලංගු කරන බව ද, එකී ඇටෝර්නි බලකරු විසින් ඉහත කී බලපත්‍ර පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් අප දෙදෙනාට මින් ඉදිරියට වගකීමක් නොමැති බව ශ්‍රී ලංකා වාසී සියලු දෙනාම දැන ගනිත්වා.

අමරෝසිගේ මොරින් නිර්මලා හයිසින්ත් ප්‍රනාන්දු,
වර්ණකුලසූරිය මලිත් නිලංක ප්‍රනාන්දු.

2008 අප්‍රේල් මස 08 වැනි දින.

05-192/3

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0400001672.
ණයකරුගේ සම්පූර්ණ නම: අරඹයලාගේ ශ්‍රියානි සුමිත්‍රා.

(මෙහි මින් මතු ධිබැංකුවබ් යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2008.02.01 වැනි දින අංක 1,535 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2008.01.24 වැනි දින ධිලක්බිමබ්, ධිද අයිලන්ඩ්බ් සහ ධිතිනක්කුරල්බ් පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මයා විසින් 2008.05.26 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ පනස්දෙදහස් හයසිය පනස්හයයි ශත තිස්දෙකක් (රු. 5,52,656.32) මුදලක් වර්ෂ 2006.11.30 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ අනූඅටදහස් හත්සිය තිස්තුනයි ශත හතලිස්පහක (රු. 4,98,733.45) මුදල ද, 2006.11.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් පනස්තුන් දහස් නමසිය විසිදෙකයි ශත අසූහතක් (රු. 53,922.87) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පන්ලක්ෂ පනස්දෙදහස් හයසිය පනස්හයයි ශත තිස්දෙකක් (රු. 5,52,656.32) ද,

(2) එකී රුපියල් හාරලක්ෂ අනූඅටදහස් හත්සිය තිස්තුනයි ශත හතලිස්පහක (රු. 4,98,733.45) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.00% බැගින් වන පොලියක් 2006.12.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවේ, සුදුහුම්පොල ග්‍රාමයෙහි සුදුහුම්පොල විහාර පාරේ වරිපනම් අංක 93/54 හි පිහිටි ගුරුන්නාන්සේලාගේ හේන හෙවත් ගලබැදිතැන්න නමැති ඉඩමට 2004.07.25 දින පී. පුංචිහේවා මානක තැන විසින් මැන සම්පාදිත අංක 2421/පී පිඹුර ප්‍රකාර 2004.09.16 දින ටී. බී. අත්තනායක මානක තැන විසින් මැන සම්පාදිත උප බෙදුමක් වන ලොට් 1 ඒ ට මායිම්, උතුරට : ලොට් 1 බී ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට: කඳුර ද, බටහිරට: නිවෙස් හි සිට ප්‍රධාන පාර දක්වා වූ පාර ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනක (අක්. 0 රූඩ් 0, පර්. 13) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 338/216 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2008ක් වූ අප්‍රේල් මස 21 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

05-144

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0400000657.
ණයකරුගේ සම්පූර්ණ නම: යටිවාවල හපුකොටුවේ ගෙදර මහින්ද කුමාර හපුකොටුව.

(මෙහි මින් මතු ධිබැංකුවබ් යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2003.02.14 වැනි දින අංක 1,276 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2003.02.17 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, නුවර ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මයා විසින් 2008.05.26 වැනි දින ප. ව. 2.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැටනමදහස් හාරසිය හැත්තෑඅටයි ශත පනස් අටක් (රු. 1,69,478.58) මුදලක් වර්ෂ 2002.05.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හය දහස් එකසිය දෙකයි ශත විසිහතරක (රු. 1,06,102.24) මුදල ද, 2002.05.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් හැටතුන්දහස් තුන්සිය හැත්තෑ හයයි ශත තිස්හතරක් (රු. 63,376.34) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක් ලක්ෂ හැටනමදහස් හාරසිය හැත්තෑඅටයි ශත පනස් අටක් (රු. 1,69,478.58) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හය දහස් එකසිය දෙකයි ශත විසිහතරක (රු. 1,06,102.24) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.00% බැගින් වන පොලියක් 2002.06.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

ඉහත සඳහන් දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව කුළුගම්මනසිය පත්තු යටිවාවල පිහිටි හපුකොටුවේ හිටිනගෙදර වත්තට වර්ෂ 1996.08.06 දින එච්. ඩී. පී. ගුණවර්ධන මානක තැන විසින් මැන සැකසූ අංක 573 පිඹුරේ ප්‍රකාර ලොට් අංක 1 බී ට මායිම් - උතුරට: ඇල ද, නැගෙනහිරට: ලොට් අංක 1 සී ද, දකුණට : ලොට් අංක 1 ඊ ද, බටහිරට : ලොට් අංක 1 ඒ ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම හතක (අක්. 0, රූ. 0, පර්. 10.7) වපසරියකින් යුතු වූ මෙම ඉඩම ලොට් 1 ඊ, මාර්ග පරවශතාවය ද, සමග නුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 621/38 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2008ක් වූ අප්‍රේල් මස 21 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

05-143

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0400000766 සහ 0404400285
ණයකරුගේ සම්පූර්ණ නම: මද්දුම ලියනගේ හේමන්ත පුෂ්පකුමාර සහ කුලසේකර මුදියන්සේලාගේ ප්‍රේමලතා කුලසේකර

(මෙහි මින් මතු විබැංකුවබි යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2002.11.01 වැනි දින අංක 1261 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2008.01.31 වැනි දින විලක්බිමබි, සහ 2008.02.01 වැනි දින විද අයිලන්ඩ්බි සහ"තිනක්කුරල්බි පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මයා විසින් 2008.05.26 වැනි දින ප. ව. 3.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ විසිහතර දහස් පන්සිය අසූ තුනයි ශත හැත්තෑනමයක (රු. 324,583.79) මුදලක් වර්ෂ 2002.02.28 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ හාරදහස් තුන්සිය අසූවයි ශත විසිහයක (රු. 204,380.26) මුදල ද, 2002.02.28 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක්ලක්ෂ විසිදහස් දෙසිය තුනයි ශත පනස් තුනක් (රු. 120,203.53) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ විසිහතර දහස් පන්සිය අසූතුනයි ශත හැත්තෑනමයක (රු. 324,583.79) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ හාරදහස් තුන්සිය අසූවයි ශත විසිහයක (රු. 204,380.26) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.50% බැගින් වන පොලියක් 2002.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### ඉහත සඳහන් දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාවේ, ගඟවට කෝරලේ, මහනුවර දේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ තල්වත්ත වටපුළුව පිහිටි වරිපනම් අංක 105 ධර්මාශෝක මාවතේ පිහිටි අරුප්පොල ජනපදය ඉඩමට 1992.11.14 දින ටී. බී. අත්තනායක මානකගේ අංක 3163 පිඹුර ප්‍රකාර කැබලි අංක 3 මායිම් ඊසානට : කැබලි අංක 4 ද, ගිණිකොණට : වරිපනම් අංක 107 දරන දේපළ ද, නිරිතට : ධර්මාශෝක මාවත ද, වයඹට : කැබලි අංක 2 යන මායිම් තුළ පර්චස් දහයයි දශම දෙකක් (අක්. 0, රූ. 0, පර්. 10.2) විශාල ඉඩම ඒ තුළ පිහිටි සෑම දේ සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක එල්. ඩී ඕ. ඒ/02/35ඒ/96 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2008ක් වූ අප්‍රේල් මස 21 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

05-145

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2000000206.
ණයකරුගේ සම්පූර්ණ නම: බුළුගහවත්ත මුතුබණ්ඩාරගේ සුමනදාස බුළුගහවත්ත.

(මෙහි මින් මතු විබැංකුවබි යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2007.06.29 වැනි දින අංක 1500 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2008.03.28 වැනි දින විලක්බිමබි, විද අයිලන්ඩ්බි සහ විතිනක්කුරල්බි පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල මයා විසින් 2008.05.27 වැනි දින ප. ව. 2.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ එක්දහස් පන්සිය අසූතුනයි ශත දාහතක (රු. 101,583.17) මුදලක් වර්ෂ 2004.11.30 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූඑක්දහස් එකසිය අසූහයයි ශත පනස්හතරක් (රු. 91,186.54) මුදල ද, 2004.11.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් දහදහස් තුන්සිය අනූහයයි ශත හැටතුනක් (රු. 10,396.63) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ එක්දහස් පන්සිය අසූතුනයි ශත දාහතක (ɾු. 101,583.17) ද,

(2) එකී රුපියල් අනූඑක්දහස් එකසිය අසූහයයි ශත පනස්හතරක් (රු. 91,186.54) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.50% බැගින් වන පොලියක් 2004.12.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කන්දෙ කෝරළේ, රඹෑවැව ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 85 හි ගල්කන්දෙගම ග්‍රාමයෙහි පිහිටි ගොඩ ඉඩම නැමැති ඉඩමට 2000.08.14 දින ඒ. එම්. බී. රත්නසිරි මානක තැන විසින් මැන සම්පාදිත අංක 709 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම් උතුරට එම්. සුමනදාසට අයත් ඉඩම ද, නැගෙනහිරට එම්. මැණික්පාල ට අයත් ඉඩම ද, දකුණට කෙන්ඩව සිට ගල්කෙන්දෙගම දක්වා වූ පාරද, බටහිරට එම්. නන්දසේනට අයත් ඉඩම ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තිස්නමයයි දශම බිංදුවයි එකක (අක්. 0 රූඩ් 01 පර්. 39.01) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. ජයභූමි 177/207 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2008ක් වූ අප්‍රේල් මස 23 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

05-142

---

**ලංකා බැංකුව**

ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වෙනි වගන්තිය හා එහි සංශෝධන යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

යොමු අංකය : 99/05

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007.12.14 දිනැති අංක 1528 දරන ගැසට් පත්‍රයේ හා 2007.12.07 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2008.06.26 වෙනි දින පෙ.ව. 10.30 ට කුලියාපිටිය, පන්නල පාර, අංක 56 හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියස් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල, හත්පත්තුවේ යටිකහ කෝරලේ දකුණ, බිහල්පොල හි පිහිටි මැදපිල්ලෑව හෙවත් අම්බලන්වත්ත යනුවෙන් හඳුන්වන හා නමැති ඉඩම් කැබැල්ල උතුරට මාදම්පේ පාරද, නැගෙනහිරට අප්පුහාමි සහ අනෙක් අයගේ ඉඩමද දකුණට නැසී ගිය මැණික්හාමිගේ කුඹුර සහ කමතද, බස්නාහිරට මරියනෝනාගේ ඉඩමේ වැටද මායිම්ව කුරක්කන් ලාස් එකක් වපසරිය ඇති ඉඩම සහ එය තුළ පිහිටි සියලු දේ වේ.

මෙය කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ40/125 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම ඉතා මෑත මිණුම් පිඹුරට, අනුව පහත සඳහන් පරිදි වේ :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ යටිකහ කෝරලයේ දකුණ, බිහල්පොල හි පිහිටි මැදපිල්ලෑවවත්ත හෙවත් අම්බලන්වත්ත යනුවෙන් හඳුන්වන හා නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඒ. එන්. ගුණසිරි විසින් සාදන ලද 2004.09.01 දිනැති අංක 3873 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල එකී අංක 3873 දරන පිඹුර අනුව උතුරට කුලියාපිටිය කුරුණෑගල ප්‍රධාන පාරද, නැගෙනහිරට සහ ගිණිකොණට කරුණාරත්නගේ ඉඩමද, නිරිතදිගට කරුණාරත්න ගේ කුඹුර සහ කරුණාරත්නගේ ඉඩමද, මායිම්ව රූඩ් දෙකයි, පර්චස් දොලහයි දශම හතක (අ.0, රූ. 02, පර්. 12.7) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ඒ. උපාලි,
කළමනාකරු.

ලංකා බැංකුව,
කුලියාපිටිය.

05-140

---

**ඩීඑෆ්සීසී බැංකුව**

(කලින් ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව යැයි හඳුන්වනු ලැබීය)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අට වැනි වගන්තිය යටතේ සිදු කරනු ලබන විකිණීම් 2 ක්

ගම්මඩුව ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට් ලිමිටඩ්)

**දේපළ උකස් කිරීමට අදාළ බැඳුම්කරය අංක 10563**

බදු හිමිකම් නිමා වී ඇත.

මධ්‍යම පළාතේ, නැගෙනහිර මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ අඹන්ගග කෝරලේ, ගම්මඩුව ගම්මානයේ පිහිටි, ගම්මඩුව වතුයායේ (ගම්මඩුව වසම) වැවිලි වතු, බංගලා, ලයින් කාමර, කාර්යාලීය බර කිරුම් කාමර සහ එහි පිහිටි සියලු දේ ද බලයලත් මානක පී. එස්. එම්. එම්. පාදෙනිය

විසින් සාදන ලද 1997 දෙසැම්බර් 29 දාතම හා අංක 68/97 නම් වූ පිඹුරේ ලොට් අංක 1, 2, 3 සහ 4.

ඉඩමේ ප්‍රමාණය.- ලොට් අංක 1, 2 සහ 3 - 205.3296 හෙක්ටයාර්
ලොට් අංක 4 - 45.4548 හෙක්ටයාර්

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද මහතා විසින් සහතික කරන ලද, 2004 ඔක්තෝම්බර් මස 12 දිනැති, අංක 10563 උකස්කරය ප්‍රකාර, මොරටුවෙහි කාර්යාලය පිහිටි ගම්මඩුව ප්ලාන්ටේෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින්, ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නො කරන ලද දේපළ, ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2008 මැයි මස 29 වෙනි දින (බ්‍රහස්පතින්දා) පෙරවරු 11.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර)
4. රු. 31,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500.00
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංක : 011-2440366/77

ෂොක්මන් සහ සමරවික්‍රම,
ISO 9001 : 2000 සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, උපදේශක,
තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය,*
24, ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන 081-2227593
දුරකථන/ෆැක්ස් 081-2224371
ඊ මේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය*
290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් 2588176
ඊමේල් :schokman@samera1892.com

05-158

**ඩීඑෆ්සීසී බැංකුව**
(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රංශ්‍යා ට්‍රේඩ් සෙන්ටර්

**අංක 9964 ඇපකරය යටතේ උකස් කර ලද දේපළ පිළිබඳ විස්තර**

ඌව පළාත, මොනරාගල දිස්ත්‍රික්කයෙහි මොනරාගල කොට්ඨාසයට අයත්, මුප්පනයෙහි පිහිටි, බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර මහතා විසින් සහතික කරන ලද, 07.10.1995 දාතමින් යුත් පිඹුරුපත් අංක 289 හි, ලොට් අංක 1 හා බලයලත් මිනින්දෝරු ඩබ්. විල්මොට් සිල්වා මහතා විසින් සහතික කරන ලද, 1980.06.28 දාතමින් යුතු පිඹුරුපත් අංක 212 හි ලොට් අංක 15, 16 හා 17 ලෙස සඳහන් එගොඩවත්ත ලෙස හැඳින්වෙන ඉඩම. ඉඩමේ ප්‍රමාණය : ලොට් අංක 15 අක්. 0, රූඩ් 0, පර්. 2.19 ලොට් අංක 16, අක්. 0, රූඩ්. 0, පර්. 0.05 ලොට් අංක 17 අක්. 0, රූඩ්. 0 පර්. 0.85 (බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර මහතා විසින් සහතික කරන ලද 1995.10.17 දාතමින් යුතු පිඹුරු පත් අංක 289 හි ද සඳහන්)

ලොට් අංක 01 අක්. 0, රූඩ්. 0, පර්. 04 එහි පිහිටි සියල්ල සහිතව ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2008 මැයි මස 27 වෙනි දින (අඟහරුවාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. එදිනම මධ්‍යාහ්න 12.00 ට පිහිටි ස්ථානයේ දී

**අංක 10193 ඇපකරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

ඌව පළාත, මොනරාගල දිස්ත්‍රික්කයෙහි, මොනරාගල කොට්ඨාසයට අයත්, බුත්තල මුප්පනගමෙහි පිහිටි, බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර මහතා විසින් සහතික කරන ලද, .2004.01.03 දාතමින් යුතු පිඹුරුපත් අංක 4327 හි, ලොට් අංක 1 ලෙස සඳහන් "පොල්ලන්දේකනත්ත" ලෙස හැඳින්වෙන ඉඩම. ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ්. 0, පර්. 9.2 එහි පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දෑ ඇතුළත්ව බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද මහතා විසින් සහතික කරන ලද, 2003 දෙසැම්බර් මස 19 දිනැති අංක 9964 උකස්කරය ප්‍රකාර හා 2004 අප්‍රේල් මස 28 දිනැති, අංක 10193 උකස්කරය ප්‍රකාර, මොනරාගල පිහිට රංශ්‍යා ට්‍රේඩ් සෙන්ටර් හි හිමිකරු ලොකුහේවා ගමගේ රංජිත් යන අය විසින්, ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකර ලද දේපළ.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර)
4. රු. 36,500.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500.00
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න ඃ දුරකථන අංක 011-2440366.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ISO 9001 : 2000 සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ
ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
උපදේශක තක්සේරුකරුවෝ සහ ඉඩම්
අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය,*
24 ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන 081-2227593
දුරකථන/ෆැක්ස් 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය,*
290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් 2588176
ඊමේල් : schokman@samera1892.com

05-157

---

**හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. - තලංගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දා වූ 2007.02.08 දින සහ අංක 2840 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුමාරගේ දොන් නිමල් ධර්මසිරි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් , සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2008 මැයි මස 27 වන දින පෙ.ව. 10.00 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කොට්ටාව ගමේ, පිහිටි දෙල්ගහවත්ත හෙවත් පෝරගේ වත්ත නමින් හඳුන්වන ඉඩමට (බලයලත් මානක බී. එස්. එස්. කුරුප්පු විසින් මැන සාදන ලද අංක 2303 ඒ සහ 1993 අප්‍රේල් මස 29 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් බී 3 ට අයිති උප බෙදුමක් ලෙස) බලයලත් මානක කේ. එන්. ඒ. අල්විස් විසින් මැන සාදන ලද අංක 973 සහ 1996 ජුනි මස 29 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වේ.

විශාලත්වය පර්චස් 15

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.02.15 දින දරන ගැසට් පත්‍රය හා 2008.03.04 වන දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියක් (රු. 500) ද,
5. සියලුම ප්‍රචාරක වියදම්ද,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය.

අදාළ ඔප්පු සහ අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661815/2661816 න් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු,
දු. ක. 2863121.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

05-160/1

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ඇඹිලිපිටිය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. කොස්ගොඩගේ විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දා වූ 2004.02.03 දින සහ අංක 190 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඇන්ද්‍රා බඳුගේ ආරියසේන සහ වනුම්පුරගේ විමලාවතී යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2008.05.30 වැනි දින පෙ.ව.

11.30ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්නේ කෝරළේ, දියපොටගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, ඇඹිලිපිටිය, උඩගම ගමේ, කොන්කටුවෙහි පිහිටි උක්වත්ත (වඩාත් නිවැරදි ලෙස කෝන්ගහ වත්ත නොහොත් උක්වත්ත) දරන ඉඩමට බලයලත් මානක කේ. ජී. ධර්මරත්න විසින් මැන සාදන ලද 1999.08.23 දිනැති අංක 1296 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස සලකුණු කරන ලද ඉඩම් කොටස වේ.

විශාලත්වය රූඩ් 3, පර්චස් 27.5

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.02.08 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2008.02.19 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියක් (රු. 500) ද,
5. සියලුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000) ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී වෙත ගෙවිය යුතුය.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826/2661816 න් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.
දු. ක. 2863121

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ.
කෝට්ටේ.

05-160/2

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. -කුරුඳුවත්ත ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් සහ යන්ත්‍රෝපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. තිරුකේෂ්වරන් විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දා වූ 1993.01.05, 1993.11.16 දිනැති සහ පිළිවෙලින් අංක 299 සහ 489 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යුතයිටඩ් පී. පී. සැක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2008 මැයි මස 26 වන දින පෙ.ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ අලුත්කුරු කෝරලේ, දූනගහ පත්තුවේ, ආඩිමුල්ල ගමේ, පිහිටි බලයලත් මානක ටී. සී. එස්. ප්‍රනාන්දු විසින් සාදනු ලැබූ අංක 975 සහ 1969.05.28 දින දරන පිඹුරේ දැක්වෙන ඉඩමෙන් කොටසක් වූ බලයලත් මානක චෝල්ටර් ඒ. ප්‍රනාන්දු විසින් සාදනු ලැබූ අංක 5082 බී දරන පිඹුරේ දක්වා ඇති ෆැන්සිල් එස්ටේට් නමැති බෙදා වෙන් කළ අක්කර 2යි , රූඩ් 3, පර්චස් 20 විශාලත්වය ඇති ඉඩම සහ එහි ඇති ගොඩනැගිල්ලට සවිකරනු ලබන ඊට අනුබද්ධ සියළු උපාංග සහ පහත විස්තර කරනු ලබන සියළු යන්ත්‍රෝපකරණ ආදිය ද සමග වේ.

යන්ත්‍රෝපකරණ පිළිබඳ විස්තර :-

| | |
|---|---|
| ද්‍රව්‍ය මිශ්‍රකරන පතිය, මැස්ස, ඉණිමග, සංරචක 3/චූෂණ 2 පැයට කි. ග්‍රෑ. 400 දක්වා වූ මාත්‍රා හා චූෂණ ඒකකයන් සහිත මාත්‍රා (ඩෝසිං) ඒකකය | 01 |
| 9028 සැකසිය හැකි තිරස් නෙරවනය | 01 |
| නිවාරක පටි පෙරහනය මි. මී. 750 අනුහුරුකුරු පැතලි කැටය සහිත නෙරවුම් අවුද ඒකකය | 01 |
| ඇල්කිරීමේ පිරිවටන ඒකකය, ජල චූෂණ සහ මාරුකිරීමේ (සිසිල් කිරීමේ සමාහාරය රහිත) සහිත ජල ටැංකිය යුක්ත සිසිල් කිරීමේ සහ ඉගිලුම් ඒකකය එල් කේ ඒ 10 ඩබ් 0750 | 01 |
| එල්එස් ඊ 6/වි එස් ආකෘතියේ නෙරපුම් හා කැපුම් ඒකකය | 01 |
| ප්‍රසාරණ රෝලය, දිග දීමේ එලක තෙල්ටැංකිය, ස්විච් පෝරුව, ඉගිල්වීමේ හා ස්ථායිකරණය ඒකකය, අයනීකරණ එතුම් ආරම්භකය ආදියෙන් සංයුක්ත වූ දිග ඇදීමේ ඒකකයන් කැට ටැංකිය සහිත දාර මට්ටම් ප්‍රලාභ ක්‍රමය | 01 |
| අඩු පීඩන කුටීරය සහිත ඩබ් බී 0750 තනි පටල තීරුවක් සඳහා පටි චූෂකය | 01 |
| (ආවුද කැබිනෙට්ටුව රහිත) කාර්‍ය්‍ය කර්ම ආකල සහ සහායක ආවුද | 01 |
| ඩෙන්. 1400 දක්වා වූ පැකේජයේ උපරිම විෂ්කම්භය මි. මී. 160 බැන්ඩෝමැට් 200ඊ වර්ගයේ දික් නූල් සහ හරස් නූල් ඔතනයන් | 110 |
| අත් චූෂකයන් 2 ක් පනා, පීඩනය සහිත වායු බට හා කුඩා කොටස් සහිත ඔතනයන් සඳහා වූ සහායක කට්ටල ආදියෙන් සමන්විත වන්නා වූ චෝටර් කෙටන්ස් පද්ධතිය | 10 |
| ලෙන්සිං පිල්ම් ටේප්ලයින් පිල්ම් මගින් එල් ඊ එෆ් 10/6/90/ඩබ් - වී 3 එෆ් 0750/250 ඩී සී 50 වර්ගය | 01 |
| උපරිම වශයෙන් දික්නූල් මධ්‍යයෙන් 560 ක් සඳහා වූ දික් නූල් රාක්ක | 01 |
| නඩා 4, දික් නූල් හා හරස් නූල් පාරිපාලනය පෙහෙර මුදු 1, නල නියාමක 2, පැතුරුම් උපක්‍රම, මැස්ස, ආධාරකය, ඇතුලත පටි එතුම් පද්ධතිය, තෙතමනය, ඇති කිරීම් උපක්‍රමය, ස්නේහක පද්ධතිය, මීටර කවුන්ටරය, ඉගුලුම් ඒකක පැදවීම, කප්පි 2, (මි. මී. 400-750 නලය සහිත) පෙහෙර නිර්මාන පහලක කුට් ප්‍රත්‍යාවර්ථනය පිණිස වූ ගියර 7 රෝද සහිත පෙහෙර ඒකකය | 01 |
| බවටත්, පෙහෙර සඳහා වූ එතුම් කඳ සහ බොබින් හෝල්ඩර් 2 ක් සහිත ඔතනය | 01 |
| බැගින් එකක් සමන්විත වන්නා වූ එල් එස් ආර් ඩබ් 4/560/ජී | |

| | |
|---|---|
| වර්ගයේ ලෙන්සින් ලයිසන්ස් සර්කියුලුම් (චක්‍රීය වියන යන්ත්‍රය) | 12 |
| උපරිම වශයෙන් දික් නූල් මධ්‍යයෙන් 750 සඳහා වූ දික් නූල් රාක්ක | 01 |
| පෙහේර මුදු, (ප්‍රතිරූටන විවීම් සඳහා) 4 කේ නඩා 4 ක්, නල නියාමක 2, පොඩෙස්ට්, ආධාරකය, පැතුරුම් උපක්‍රමය, ග්‍රීසිං මීටර් කවුන්ටර්, ඉගුළුම් ඒකකය, තෙතමන උපක්‍රමය, පැදවීම් කප්පි 2, ඒ වී 400 750, දිග පෙහෙර නිර්මාණ තලය, ප්‍රත්‍යාවර්ථනය සඳහා වූ ගියර් 6 රෝද සහිත පෙහේර ඒකකය, | 01 |
| බටවත් පෙහෙර සඳහා වූ එතුම් කඳ හා බොබිං හෝල්ඩර් 2 ක් සහිත ඒකකය | 01 |
| බැගින් එකක් සමන්විත වන්නා වූ එල් ආර් ඩබ් 4/720/ජී වර්ගයේ ලෙන්සිං සර්කියුලලුම් (චක්‍රීය වියන යන්ත්‍ර) | 05 |
| ඉවතට ඇදෙන ට්‍රොලිය, සංචායවනය, කැපීමේ උපක්‍රම රහිත කැපුම් ඒකකය, සංක්‍රමණ ඒකකය, බොත්තම් මැසීමේ ඒකකය, (යූනියන් ස්පෂෙල් හි මහන මැෂිම) ආදියෙන් යුක්ත ලුප්ත හා අලුප්ත වටවත්ව වියන ලද රෙදි පිලි සඳහා වූ (සැක් සොයිං ලයින් බේසින් යුනිට්) ගෝනි හැඩ මැසීමේ පාදක ඒකකය | 01 |
| තාප අක්වත් කැපුම් සඳහා කැපුම් උපක්‍රමය | 01 |
| ගෝනි කවුන්ටරය සහිත ගෝනි අට්ට ගැසීමේ මේසය | 01 |
| කට්ටල සෑදීමේ ද්‍රව්‍යයන් (සෙට් ඔපරේෂන් මැටිරියල්ස්) | 01 |
| සමන්විත වන්නා වූ එල්එස් එන් එල් 6 වර්ගයේ ලේසින් සැක් සොවිං ලයින් | 01 |
| පෝෂක මේසය, වර්ණ මුද්‍රණ පූර්ණ ඒකක 2 ක්, වැඩි කිරීමේ ද්‍රව්‍ය ත්‍රිවිධ පරිවටන සීරු මාරුව, සුලු කෑම කවුළු සහිත අට්ටි ගැසීමේ මේසය ආදියෙන් සමන්විත අසන්තක සේවා සඳහා වූ ලේසිං සැක් මුද්‍රණ යන්ත්‍රය එල් එස්ඩීඑම්/2/ඩී වර්ගය | 01 |
| පටි උපක්‍රමය සඳහා සීරු මාරු කළ හැකි කිලෝග්‍රෑම් 25 -50 දෝලකය සහිත ටොන් 2/5 උපරිම පීඩන බලය සහිත ලෙන්සිං බෝලිං ජෙස් IV වර්ගය | 01 |
| ලෙන්සිං ප්‍රෙස් ට්‍රොලි | 02 |
| මි. මී. 10-19 පළල මි. මී. 0.4 0.6 ගණකම ඇති ද්‍රව්‍ය 31.931 ප්ලාස්ටික් පටි (සයිකෙලොප්) සඳහා වූ කම්පන මැසීමේ අත් උපකරණය | 01 |
| ශීතක වියලනය සින්ක් ආලේප කළ සි වී 2000 10- v වා ටැංකිය, විපටයීය | 01 |
| නලයක් සහිත පැයට ඝණ මී. මී. 160 ධාරිතාව ඇති ඇට්ලස් කොස්කෝවා සම්පීඩකය | 01 |
| සි17/2, සහ සී 40 පරිසර උෂ්ණත්වයේ වූ ඇල් ජලය සීත කිරීමේ පැයට කිලෝ කැල් 5000 උපරිම ධාරිතාව ඇති සියැට් සීත කිරීමේ සමූහය | 01 |

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.12.14 දින දරන ගැසට් පත්‍රය හා 2007.12.27 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීම් ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු.500) ද,
5. සියලුම ප්‍රචාරක වියදම්ද,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු.2,000) ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479 ටී. බී. ජායා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661815/2661816 න් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු,
දු.ක. 2863121.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

05-160/3

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව ඇතුළත රුක්මලේ ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු ආර්. ඒ. සිරිසේන විසින් සාදන ලද වර්ෂ 2004 ක් වූ දෙසැම්බර් මස 25 වන දිනැති අංක 794 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙන් කර ඇති 'දෙල්ගහවත්ත සහ ගොඩපරගහවත්ත' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම් කැබැල්ල, ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 10.75 (ඒ මත ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියළුම දේ සමග වේ).

මෙහි පහත දැක්වෙන පරිදි මාර්ග අයිතිය සහ අනෙකුත් ඒ මතින් සහ ඔස්සේ වන පොදු සමාන අනුබන්ධනද සමග (1) ඉහත කී රුක්මලේ පිහිටි බලයලත් මිනින්දෝරු ජේ. රදම්පොළ විසින් සාදන ලද වර්ෂ 1991 වූ අගෝස්තු මස 12 වන දිනැති අංක 9108 දරන පිඹුරේ ලොට් 38 වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද දැක්වෙන (මාර්ගයක් සඳහා වූ වෙන් කිරීම) ඉඩම් කැබැල්ල, ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 32.72 (2) ඉහත කී 9108 දරන පිඹුරේ ලොට් 12 වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද දැක්වෙන (මාර්ගයක් සඳහා වූ වෙන් කිරීම) ඉඩම් කැබැලල්ල, ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 17.20 කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. වීරසේකර විසින් සහතික කරන ලද්දා වූ වර්ෂ 2005 ක් වූ මාර්තු මස 02 වන දිනැති අංක 225 දරන උකස් බැඳුම්කරය මගින් අයවිය යුතු මුදල් ගෙවීම බණ්ඩාරවෙල, අමුණුදෝව, ඇටම්පිටිය පාරේ පදිංචි මැණික් හිටිහාමි මුදියන්සේලාගේ ජීවානන්ද හේමන්ත කුමාර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. (කලින් සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව) විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2008 ක් වූ ජුනි මස 04 වන දින පෙ.ව. 10.00 ට ඉහත සඳහන් දේපල අප විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.11.17 වන දින රජයේ *ගැසට් පත්‍රයද* 2006.11.10 වන දින දිවයින, ද අයිලන්ඩ් සහ තිණකුරල් පුවත්පත් ද බලන්න.

*දේපලට පිවිසීම*.- කොට්ටාව නගර මධ්‍යයේ සිට අතුරුගිරිය පාරේ හැතැක්ම 2 පමණ ගමන්කළ විට බාලිකා නිවාස පාර හන්දිය හමුවේ. එතැනින් වමට ඇති නිවාස පාරේ හැතැක්ම 1/2ක් ගමන් කර රුක්මල් ගාඩ්න්ස් පාරේ අඩි 250 ක් ගමන් කළ විට වම් පසින් අදාල දේපල පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය*.- විකිණීම ස්ථිරකළ වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුයි :

01. ගැනුම් මිලෙන් සියයට දහයක්(10%),
02. ගැනුම් මිළෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුල දී නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
03. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
04. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
05. බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරක සහ අනෙකුත් වියදම්,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
07. නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

කළමනාකරු - පාරිභෝගික නීති කටයුතු

නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී. අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02.

දුරකථන අංකය : 011 - 4313131

ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවෝ,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ,
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ
දිසා අධිකරණය, බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු,

අංක 182, තෙවන මහළ, හල්ස්ඩ්‍රෝෆ් පාර,
කොළඹ 12,
දුරකථන/ෆැක්ස් : 011-2388318

05-164

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.